# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2015 දෙසැම්බර් මස 22 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.07 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජගත් අංගගේ | මොහොමඩ් ෆායිස් |
| අනුරාධ විමලරත්න | ජගත් කුමාර | යූ.එල්.එන්.පී. උඩවෙල |
| අනුරුද්ධ ලේකම්ගේ | ජගත් පී. විතාන | රජිත හපුආරච්චිගේ |
| අසෝක රන්වල | ජනක දීපාල් වැලිවත්ත | රන්දීර් රොද්‍රිගෝ |
| අශෝක දයාරත්න | ජයන්ත ද සිල්වා | රවී විජේසේකර |
| අමල් සිල්වා | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | රොජර් සෙනෙවිරත්න |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් |
| ඇන්ටනී උපුල් රාජිත | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | රොයිස් විජිත |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | තෙබුවන පියනන්ද හිමි | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| ඉන්දික බණ්ඩාර | නව්සර් ෆව්සි | ලයනල් ජයසිංහ |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | නිමල් ආර්. පීරිස් | ලලන්ත ගුණසේකර |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිමල් චන්ද්‍රරත්න | ලලිත් එල්ලාවල |
| උදාර රත්නායක | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලලිත් වර්ණකුමාර |
| උදේන විජේරත්න | නිරෝෂන් පාදුක්ක | ලෙනාඩ් කරුණාරත්න |
| උපාලි කොඩිකාර | නිරෝෂා අතුකෝරල මැතිනිය | විජිත් ප්‍රියන්ත |
| උපාලි ගුණරත්න | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | පී.ආර්.පී. අබේගුණවර්ධන | සරත් පතිරණ |
| එම්.එස්.එම්. රහීම් | පී.ඩී. අබේරත්න | සරත් සුමනසේකර |
| එස්.එම්. සකාවුල්ලා | ප්‍රදීප් උඳුගොඩ | සහන් ප්‍රදීප් |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය | ප්‍රදීප් පෙරේරා | සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සුනිල් වටගල |
| කාමල් කුරුප්පු | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සුසිල් කිඳෙල්පිටිය |
| කිත්සිරි කහටපිටිය | මහින්ද ජයසිංහ | සෙනල් වෙල්ගම |
| කීර්ති කාරියවසම් | මහේෂ් අල්මේදා | සේනක දමයන්ත ද සිල්වා |
| කුරුසාමි කලන්කාඩි තේවර් | මංජුල ප්‍රසන්න සම්පත් | ශිරන්ත අමරසේකර |
| කේ.ඩී. අරුණ දීපාල් | මංජුල බුද්ධදාස | ශ්‍රීනාත් පෙරේරා |
| කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | මෙරිල් පෙරේරා | හරිස්චන්ද්‍ර කොස්තා |
| ගුණසිරි ජයනාත් | මොරිස් විජේරත්න | හෙක්ටර් බෙත්මගේ |
| චන්දන ජයකොඩි | මොහොමඩ් ෆයිරුස් | |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| එස්. කුහවරදන් | රවීන්ද්‍ර යසස් කුමානායක | සුසාර දිනාල් |
| කොලන්නගේ වජිර පෙරේරා | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය | |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | සලෝචන ගමගේ | |

## 01. ලිපි ලේඛන පිළිගැන්වීම :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ රීති ඇතුළත් අංක 1937/20 හා 2015.10.22 දිනැති ගැසට් පත්‍රය සභාවට පිළිගන්වන ලදී.

## 02. කාරක සභා වාර්තා :

2015.12.18 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. පළාත් සභාවේ රැස්වීම :

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින සභා රැස්වීමේදී 2016 මුදල් ප්‍රකාශය හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධ වැඩ කටයුතු නිමවා දිනට නියමිත පොදු කටයුතු සඳහාත් 2015.12.18 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළැඹුණු එකඟතාවයන්ට අනුව වූ වැඩ කටයුතු සඳහාත් ප්‍රවේශ විය යුතු අතර එම වැඩ කටයුතු 50(3) හා 50(6) හි විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතුය."*

## 04. පළාත් සභාවේ කටයුතු : II

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2015.12.18 වන දින හා 2015.12.21 දින සභා රැස්වීමේදී නිවේදනය කර ඇති හෙයින්ද, ඊට අනුගතව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයට අයත් කලින් නියම කර ගත් වැඩ කටයුතු නිම වූ ඉක්බිතිවම එකී "තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත" සම්බන්ධ වැඩ කටයුතු සඳහා ප්‍රවේශ විය යුතු යැයිද, එම වැඩ කටයුතු සඳහා රීති අංක 8(5), 8(6), 15(1), 15(2), 15(4), 57(1), 57(2), 57(3), 57(4), 57(5), 59(1), 63(අ) 2, 63(අ) 3, 88(2), 88(3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයිද සලකා ක්‍රියා කළ යුතුය."*[1]

## 05. වාර්ෂික මුදල් ප්‍රකාශය : 2016

ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදුයෙන්, පූ.භා. 09.19 ට පළාත් සභාව, පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය. *[ප්‍රගතිය - 2015.12.21]*

**පූර්ණ කාරක සභාව :**

**ශීර්ෂ අංක :**

**105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය**

**113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**114 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**115 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**116 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

[1] 2015.12.22 නිල වාර්තාව බලන්න.

*ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යන ශිර්ෂවලින් රුපියල් 10/- බැගින් කපා හැරිය යුතු යැයි උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් 2015.12.21 වන දින ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ගරු අශෝක දයාරත්න*
*ගරු සුනිල් වටගල*
*ගරු රංජිත් සෝමවංශ - අමාත්‍ය*
*ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායක*
*ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ - අමාත්‍ය*

*පූ.භා. 09.59 ට අංක 105, 113, 114, 115 හා 116 යන වැය ශිර්ෂයන් පිළිබඳ විවාදය අවසන් විය.*

***අනතුරුව,***

***ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් එකී වැය ශිර්ෂයන් වෙනුවෙන් බෙදීමක් ඉල්ලූ බැවින්, ගරු සභාපතිතුමා විසින් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***

***අනතුරුව,***

***ශීර්ෂ අංක 105 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 23 යි, විරුද්ධව 45 යි, වැළකුණු 03 යි යනුවෙන් බෙදුණේය.***

***ශීර්ෂ අංක 113 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 23 යි, විරුද්ධව 45 යි, වැළකුණු 03 යි යනුවෙන් බෙදුණේය.***

***ශීර්ෂ අංක 114 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 23 යි, විරුද්ධව 45 යි, වැළකුණු 03 යි යනුවෙන් බෙදුණේය.***

***ශීර්ෂ අංක 115 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 23 යි, විරුද්ධව 45 යි, වැළකුණු 03 යි යනුවෙන් බෙදුණේය.***

***ශීර්ෂ අංක 116 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 23 යි, විරුද්ධව 45 යි, වැළකුණු 03 යි යනුවෙන් බෙදුණේය.***

## 06. 2016 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2015.11.24 වන දින සභාභිමුඛ කරන ලද
*"2016 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*
යන යෝජනාව, යළිත් සභාභිමුඛ කරන ලදී.

*ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි*
*ගරු මහේෂ් අල්මේදා*
*ගරු සුසිල් කිඳෙල්පිටිය*

***පූ.භා. 10.35 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*ගරු ජගත් අංගගේ*
*ගරු කිත්සිරි කහටපිටිය*
*ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව*
*ගරු නිරෝෂන් පාදුක්ක*
*ගරු ලලිත් එල්ලාවල*
*ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායක*

***පූ.භා. 11.40 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යවර*

*පූ.භා. 11.59 ට 2016 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය අවසන් විය.*

***අනතුරුව,***

***සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යන වැය ශීර්ෂයන් සම්බන්ධව විරුද්ධ බව ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් විසර්ජන ප්‍රඥප්තියේ ඊට අදාළව බෙදීමක් ඉල්ලූ බැවින්,***

***ඒ අනුව ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යන සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයන් හැර සෙසු වැය ශීර්ෂයන්ට අදාළව විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 89 යි, විරුද්ධව 06 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

**අ.භා. 12.15 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] විසින් පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වාර්තා කරන ලදී.**

## 07. 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 53 වන වගන්තිය විධිවිධාන යටතේ සාදනු ලැබූ, බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ රීති නම් රීතීන් අංක 1937/20 හා 2015 ඔක්තෝබර් මස 22 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය [IV(අ) වැනි කොටස - පළාත් සභා] පළාත් සභා මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර, එම රීතීන් යථෝක්ත ප්‍රඥප්තියේම 53(4) උප වගන්තියට අනුකූලව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි."*

***මේ පිළිබඳ වැඩිදුර සළකා බැලීම සඳහා ගරු සභාපතිතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 08. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත :

*එවලේ, ගරු මන්ත්‍රීවරුන් විසින් "තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් විය යුතු බව යෝජනා කරන ලදුව, ගරු සභාපතිතුමා විසින් ඒ පිළිබඳ ඉදිරි වැඩ කටයුතු සඳහා ලේකම් වෙත යොමු කරන ලදී.*

## 09. කල් තැබීම :

අනතුරුව, ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව පළාත් සභාව, අ.භා. 12.24 ට, 2016 ජනවාරි මස 05 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.12.22
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කුමා/22
Minuts 2015.12.22 - Hansard Section